(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 2(2).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 ජූනි 22 බදාදා**

---

**2022 ජූලි 04 සඳුදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝග (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මාර්තු 10 දිනැති අංක 2270/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2022 මැයි 18 දිනැති අංක 2280/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මාර්තු 03 දිනැති අංක 2269/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මාර්තු 03 දිනැති අංක 2269/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මාර්තු 09 දිනැති අංක 2270/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මාර්තු 28 දිනැති අංක 2273/01 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 අප්‍රේල් 13 දිනැති අංක 2275/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2022 මැයි 18 දිනැති අංක 2280/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතය,— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ, ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2022.06.21 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2022 මාර්තු 09 දිනැති අංක 2270/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මැයි 31 දිනැති අංක 2282/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.22 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මැයි 31 දිනැති අංක 2282/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.22 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2022 ජුනි 20 දිනැති අංක 2285/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2022.06.22 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 සහ 69 වගන්ති සමඟ කියවිය යුතු, 117 වගන්තිය යටතේ ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 03 දිනැති අංක 2078/22 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ එම ගැසට් පත්‍රයේ මුද්‍රණ දෝෂ නිවැරදි කරමින් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 සහ 69 වගන්ති සමඟ කියවිය යුතු, 117 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජුනි 06 දිනැති අංක 2283/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2022 ජූලි 19 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2649/2022

ගරු රවුෆ් හකීම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පාසල්වල බුද්ධාගම, හින්දු, කතෝලික සහ ඉස්ලාම් යන ආගමික විෂයයන් සඳහා පවතින ගුරු පුරප්පාඩු පිරවීමට, 2019.05.25 දින පවත්වන ලද ධර්මාචාර්ය විභාගය සමත් වූ අපේක්ෂකයන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II ශ්‍රේණියට බඳවාගැනීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, ජාතික හා පළාත් පාසල්වල පවතින ඉහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ගුරු පත්වීම් ලබාදීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

(iii) 2019 වර්ෂයේ ධර්මාචාර්ය විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් සඳහා නියමිත කාලසීමාව තුළදී පත්වීම් ලබා නොදීම හේතුවෙන් රාජ්‍ය සේවයට බඳවාගැනීමේ උපරිම වයස් සීමාව ඉක්මවා යෑමෙන් ඔවුන්ට බලවත් අසාධාරණයක් සිදු වන බව දන්නේද;

(iv) ඉහත පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයන්ට නොපමාව පත්වීම් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2654/2022

ගරු මයන්ත දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කර ඇති රැකියා ලක්ෂයක් ලබාදීමේ වැඩසටහන මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන බව දන්නේද;

(ii) එම රැකියා ලබා දීමේදී අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය කවරේද;

(iii) එම වැඩසටහන යටතේ මේ වනතෙක් ලබා දී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(iv) එම රැකියාවල රාජකාරි ස්වභාවය කවරේද;

(v) එම රැකියාලාභීන් අනුයුක්ත කරන ලද ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2689/2022

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එවකට ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද "නිල සෙවණ" ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ වර්ෂ 2016 සිට 2019 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ "නිල සෙවණ" ඉදිකරන ලද එක් එක් ග්‍රාම නිලධාරි වසමේ නම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම කවරේද;

(ii) එම එක් එක් "නිල සෙවණ" ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2020 සහ 2021 වර්ෂවල ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම "නිල සෙවණ" ඉදිකරනු ලැබූ එක් එක් ග්‍රාම නිලධාරි වසම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) එම එක් එක් "නිල සෙවණ" ඉදිකිරීම සඳහා වැය කරනු ලැබූ මුදල කොපමණද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2750/2022

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාත තුළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් ඩිපෝ 7ක් ස්ථාපිත කර තිබුණද, එම ඩිපෝවල පවතින බස්රථ හිඟය හා සේවක මණ්ඩලවල පවතින පුරප්පාඩු හේතුවෙන් පළාතේ මහජනතාව වෙත නිසි සේවයක් ලබා දීමට නොහැකි වී ඇති බවත්,

(ii) ඒ හේතුවෙන් රාජ්‍ය සේවකයන්ට, ගුරුවරුන්ට හා පාසල් සිසුන්ට නියමිත වේලාවට අදාළ ආයතන වෙත යාමට නොහැකි වී ඇති බවත්.

(iii) ඇතැම් ගමනාන්ත වෙත ප්‍රවාහන සේවාවන් නොමැතිවීම හේතුවෙන් අධික මුදලක් වැය කරමින් ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉදිරියේදී උතුරු පළාතේ මහජනතාව වෙත ගුණාත්මක ප්‍රවාහන සේවාවක් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2771/2022

ගරු තිස්ස අත්තනායක මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු ආසියාතික කලාපීය සහයෝගීතා සංවිධානයේ (සාර්ක් - SAARC) කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙට්‍රික් ටොන් 8000ක විශේෂිත සහල් සංචිතයක්ද, 2008 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙට්‍රික් ටොන් 100,000ක ආරක්ෂිත සහල් සංචිතයක්ද ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගබඩාවල පවත්වා ගැනීම එම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස හඳුනාගෙන ඇති බව දන්නේද;

(ii) වර්ෂ 2009 සිට 2019 දක්වා ඉහත (අ) (i) හි සඳහන් එක් එක් සහල් සංචිත අනුව පවත්වා ගන්නා ලද සහල් තොග ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සංචිතවල පවත්වාගෙන යා යුතු සහල් තොග ප්‍රමාණය නිසි පරිදි පවත්වා ගනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ඉහත සංචිත සඳහා නිසි පරිදි සහල් තොග පවත්වා ගෙන නොයාම හේතුවෙන් එම සංචිත ස්ථාපිත කිරීමේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව දන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2785/2022

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ කිළිනොච්චිය සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල රජයේ පාසල්වල මේ වනවිට ගුරු සහායක පත්වීම් ලබා දී ඇති ස්වේච්ඡා ගුරුවරුන් ලෙස සේවය කරන ලද සංඛ්‍යාව කොපමණද;

(ii) එම පත්වීම් ලබා දෙන ලද පදනම කවරේද;

(iii) එම පත්වීම් ලබා දෙන ලද දිනය කවරේද;

(iv) එම ගුරු සහායකයන් පිහිටුවා ඇති වැටුප් පරිමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගුරු සහායකයන් ගුරු සේවයේ 3 (I) ශ්‍රේණියේ (ආ) තනතුරට පත් කරන ලද දිනය කවරේද;

(ii) ගුරු සහායක පත්වීම් ලබා දීමේදී ස්වේච්ඡා ගුරුවරුන් ලෙස 2013.07.01 සිට 2018.08.01 දක්වා සේවය කරන ලද කාල පරිච්ඡේදය ඔවුන්ගේ සේවා කාලයට එකතු නොකිරීමට හේතු කවරේද;

(iii) ගුරු සහායක පත්වීම් ලබා දුන් දිනය, ඔවුන්ගේ ගුරු සේවයේ මුල් පත්වීම් දිනය ලෙස සැලකීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

2839/2022

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ගණකාධිකාරිවරයකු පත් කර තිබේද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ගණකාධිකාරිවරයකු පත් කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකළපුව දිස්ත්‍රික්කයේ එරාවූර්පත්තු, කලවාන්චිකුඩි සහ පෝරතීවුපත්තු යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනේ ජනගහනය අධික බැවින් එම එක් එක් කොට්ඨාසය කොටස් දෙකකට බෙදීම සඳහා මේ වනවිට පියවර ගෙන තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2973/2022

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අඛණ්ඩ විදුලිබල සැපයුමක් සඳහා නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට දිනකට අවශ්‍ය ගල් අඟුරු ප්‍රමාණය කොපමණද;

(ii) මේ වනවිට පවතින විදේශ විනිමය අර්බුදය හේතුවෙන් ගල් අඟුරු සැපයීම සඳහා ලංසුකරුවන් ඉදිරිපත් නොවන බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් ගල් අඟුරු සඳහා ක්ෂණික මිලදී ගැනීම් කිරීමට සිදු වී ඇති බවත් දන්නේද;

(iv) මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3055/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කාබනික පොහොර ප්‍රචලිත කිරීමේ වැඩසටහන හේතුවෙන් 2022 මහ කන්නයේ වී අස්වැන්න විශාල ලෙස අඩු වී තිබෙන බව දන්නේද;

(ii) ඒ සඳහා වන්දි ලබා දීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට ලබා දී ඇති වන්දි මුදල කොපමණද;

(iv) එක් එක් දිස්ත්‍රික්කය අනුව මේ දක්වා වන්දි ලබා දී ඇති ගොවීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) වන්දි ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3079/2022

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන පුත්තලම දිස්ත්‍රික්කයේ ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල් ස්ථාපිත කර ඇති ස්ථාන කවරේද;

(iii) එම එක් එක් රෝහලේ පවතින පුරප්පාඩු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පුරප්පාඩු සම්පූර්ණ කර පුත්තලම දිස්ත්‍රික්කයේ ආයුර්වේද රෝහල් පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2022 ජූලි 20 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

8/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජ මාධ්‍ය පාලනය කිරීම සඳහා නව නීති පැනවීමට අදහස් කර තිබේද;

(ii) අධිකරණ අමාත්‍යවරයා විසින් සිංගප්පූරු රජය සමඟ මේ පිළිබඳ සාකච්ඡාවක් පවත්වා ඇති බව පිළිගන්නේද;

(iii) සමාජ මාධ්‍ය සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

37/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කැරම් ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කරන ලද මුදල;

(iii) ඉහත (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ කැරම් ක්‍රීඩා කුසලතා වර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කැරම් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ජාතික කැරම් සංගමය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

253/2022

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ බිත්තර අපනයනය කරනු ලැබුවේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iii) ඉහත කාලය තුළ බිත්තර ආනයනය කරනු ලැබුවේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

573/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුකුළු පැටව් ජනිත කරවීම සඳහා වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද මව් සතුන් සංඛ්‍යාව;

(ii) එම මව් සතුන් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මව් සතුන් ආනයනය කිරීම සම්බන්ධයෙන් යම් සීමාවක් පැනවීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපාන ලද සාධක කවරේද;

(iii) එම සීමා කිරීම, ශ්‍රී ලංකාවේ බිත්තර මිල හා කුකුළු මස් මිල කෙරෙහි ඇති කරනු ලබන බලපෑම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1031/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරඟ වාර්ෂිකව පවත්වනු ලබන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂයේ පළාත් පාසල් ක්‍රීඩා තරඟ පවත්වා තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) 2020 වර්ෂයේ සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරඟ පවත්වා තිබේද;

(iv) නොඑසේ නම්, එම තරඟ පැවැත්වීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

1185/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සීමාසහිත හේවාගම් කෝරළයේ හංවැල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ විශාල මුදල් වංචාවක් සිදු වී ඇති බවත්;

(ii) ප්‍රදේශයේ විහාරස්ථානවල හා සාමාන්‍ය ජනතාවගේ මුදල් එම සමුපකාර සමිතියට අනුබද්ධ ග්‍රාමීය බැංකුවල තැන්පත් කර ඇති බවත්;

(iii) එම තැන්පත්කරුවන්ට කිසිදු මුදලක් නැවත ලබා ගැනීමට නොහැකි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සමිතිය විසින් වංචා කර ඇති මුදල කොපමණද;

(ii) තම මුදල් ලබාගැනීමට නොහැකි වූ තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වංචාව සිදු කර ඇති ආකාරය පැහැදිලි කරන්නේද;

(iv) එම වංචාවට වගකිව යුතු අය හඳුනාගෙන තිබේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම මුදල් වංචාවට ඉහත සමිතියේ එවකට අධ්‍යක්ෂ මණ්ඩලය, සමුපකාර දෙපාර්තමේන්තු නිලධාරින් හා පෞද්ගලික සමාගමක් වගකිව යුතු බව දන්නේද;

(ii) ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේ නම්, ඒවා කවරේද;

(iii) ඔවුන්ගෙන් මුදල් අයකර තැන්පතුකරුවන්ට සහන සැලසීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3087/2022

ගරු තවරාජා කලෙයි අරසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර අධ්‍යාපන කලාපයේ වෙස්ලි උසස් පාසලේ තාක්ෂණික පීඨය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහනේ අධ්‍යක්ෂවරයාගේ 2020.06.25 දිනැති ලිපිය මඟින් ලබාදුන් අවසරය මත ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලද බවත්;

(ii) ඒ සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් එම පාසලේ පරිගණක ඒකකය සහ පංති කාමර 5ක් ස්ථාපනය කර තිබූ වසර 60ක් පමණ පැරණි ගොඩනැගිල්ල නැගෙනහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අවසරය සහ කලාප අධ්‍යාපන කාර්යාලයේ තාක්ෂණික නිලධාරින්ගේ උපදෙස් මත ඉවත් කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම තාක්ෂණික පීඨයේ ඉදිකිරීම් කටයුතු මේ වනවිට නවතා දැමීමට හේතු කවරේද;

(ii) එහි ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3176/2022

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති සංඛ්‍යාව;

(ii) ඒ අතරින් මේ වනවිට වැඩ නිම කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කාලය තුළදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව;

(ii) ඒ අතරින් මේ වනවිට වැඩ නිම කර ඇති හා වැඩ නතර කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3294/2022

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේදී රජයේ රැකියා සඳහා උපාධිධාරී අභ්‍යාසලාභින් අන්තර්ග්‍රහණය කිරීමේදී අභ්‍යන්තර සහ බාහිර උපාධිධාරින්ගෙන් අයදුම්පත් කැඳවන ලද බව දන්නේද;

(ii) උපාධිධාරින් අභ්‍යාසලාභින් ලෙස අන්තර්ග්‍රහණය කිරීමේදී විදේශීය විශ්වවිද්‍යාල මඟින් උපාධිය ලබා ගන්නා ලද උපාධිධාරින් අන්තර්ග්‍රහණය නොකිරීමට හේතුව කවරේද;

(iii) රජයේ රැකියා සඳහා අයදුම්පත් කැඳවීමේදී ඒ බව අවධාරණය නොකිරීමට හේතුව කවරේද;

(iv) අභ්‍යාසලාභින් ලෙස අන්තර්ග්‍රහණය නොකරන ලද විදේශීය විශ්වවිද්‍යාල මඟින් උපාධිය ලබා ගන්නා ලද උපාධිධාරින් සඳහා ලබා දෙනු ලබන විසඳුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3338/2022

ගරු අලි සබ්රි රහීම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම නගරයේ මූලික රෝහලක් ස්ථාපිත කර තිබෙන බව දන්නේද;

(ii) එම රෝහල සඳහා අනුමත වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට එහි සේවය කරනු ලබන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එහි මේ වනවිට පවතින වෛද්‍යවරුන්ගේ හිඟය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ඉහත රෝහලේ අවශ්‍යතා සපුරාලීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රෝහල මධ්‍යම රජයට පවරා ගන්නා ලෙස ඉල්ලීමක් කර තිබෙන බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2022 ජූලි 21 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1198/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය සහ අවසාන පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර තිබේද;

(iii) එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ අරමුණු කවරේද;

(iv) මේ වන විට එම අරමුණු ඉටු වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දැදුරු ඔය ජලාශයේ දකුණු ඉවුරු ඇලෙන් සහ වම් ඉවුරු ඇලෙන් මුදා හැරීමට සැලසුම් කර ඇති උපරිම ජලය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු සැලසුම් කරන ලද පරිදි වම් ඉවුරු ඇලෙන් සහ දකුණු ඉවුරු ඇලෙන් ජලය මුදා හැරීම සිදු කරන්නේද;

(iii) දකුණු ඉවුරේ සහ වම් ඉවුරේ ව්‍යුහයන් නිසි අත්තිවාරමකින් හෝ නිසි සම්බන්ධ කිරීම්වලින් තොරව ඉදිකර ඇති බව පිළිගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට සහ ජලයෙන් යටවන ඉඩම් සඳහා වන්දි ගෙවීමට දරන ලද පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1322/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020.12.31 දින වනවිට විශ්‍රාම වැටුප් ලබා ගනු ලබන රජයේ විශ්‍රාමිකයන් සංඛ්‍යාව;

(ii) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම වෙනුවෙන් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන්;

(iii) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයේදී අලුතින් එකතු වූ විශ්‍රාම වැටුප්ලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1472/2022

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ 2021 වර්ෂයේ යල කන්නයේ වී වගා කරන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතරින් කාබනික පොහොර භාවිතා කරමින් වී වගා කරන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) කාබනික පොහොර භාවිතා කරමින් වී වගා කරන ලද ගොවීන්ට දෙනු ලබන සහන කවරේද;

(iv) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කාබනික වී ගොවිතැන ප්‍රචලිත කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1731/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා ඉහළ නැංවීමට තීරණය කිරීම සඳහා හේතු වූ සාධක කවරේද;

(ii) විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා ඉහළ නැංවීම හේතුවෙන් වයස අවුරුදු 55 සම්පූර්ණ වීමේදී, සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීමේ හිමිකම අහිමි වන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1946/2022

ගරු ලලිත් එල්ලාවල මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ හිටපු නායක රෝහණ විජේවීර මහතාව 1989.11.12 වන දින එවකට පැවති රජය විසින් අත්අඩංගුවට ගෙන ඒ බව මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් කරන ලද බවත්;

(ii) 1989.11.13 වන දින ඔහු මිය ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රෝහණ විජේවීර මහතාගේ මරණය ස්වභාවික මරණයක්ද;

(ii) නොඑසේ නම්, ඝාතනයක්ද;

(iii) එම මරණය ඝාතනයක් නම්, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අධිකරණයක් මඟින් ලබා දෙන ලද නඩු තීන්දුවක් තිබේද;

(iv) මෙම මරණය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයකු හෝ නායකයකු හෝ විසින් නීති මඟින් කටයුතු කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1950/2022

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි ගඟ ආශ්‍රිතව ගන්නොරුව, වරාතැන්න ප්‍රදේශයේ ''හත්කිඳ'' නමින් හෙක්ටයාර 59ක පමණ විශාලත්වයකින් යුක්ත ස්වභාවික දූපත් සමූහයක් පවතින බවත්;

(ii) එම පරිසර පද්ධතියේ පවතින සුවිශේෂී ජෛව විවිධත්වය හේතුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත්ව තිබූ එම ප්‍රදේශය, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත ප්‍රකාරව 2017.06.13 දින ''වරාත හත්කිඳ පරිසර ආරක්ෂණ ප්‍රදේශය'' යනුවෙන් නම් කර තිබෙන බවත්;

(iii) එහි අනවසර ගොඩනැගිලි ඉදිනොකරන ලෙස දන්වමින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් දැන්වීම් ප්‍රදර්ශනය කර ඇති බවත්;

(iv) ඉහත පරිසර පද්ධතිය විනාශ වන ලෙස පෞද්ගලික හෝටල් ඉදිකිරීමට කටයුතු කරමින් පවතින බවත්;

(v) මහනුවර නගර සභා සීමාවෙහි ඉදිකර ඇති අනවසර ගොඩනැගිලි, මහවැලි ගඟ දූෂ්‍ය වීමට හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගන්නොරුවේ සිට නව දොඩම්වල පාලම දක්වා ඉදිකර ඇති අනවසර ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත පරිසර පද්ධතියේ ඉදිකර ඇති අනවසර ගොඩනැගිලි ඉවත් කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1962/2022

ගරු ගාමිණී වලේබොඩ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(iv) එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, ඒ සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1994/2022

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය අවධියේදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසල් නිල ඇඳුම් වෙනුවට තිළිණපත් නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එමඟින් රජයේ මුදල් අවභාවිතා කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) ඒ සඳහා වගකිව යුතු පාර්ශ්වය කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම තිළිණපත්වලට එවකට අධ්‍යාපන අමාත්‍යවරයාගේ ඡායාරූපය ඇතුළුව ඡායාරූප හතරක් ඇතුළත් කර තිබූ බව දන්නේද;

(ii) එම තිළිණපත්වලට එවකට ජනාධිපතිවරයාගේ සහ අග්‍රාමාත්‍යවරයාගේ ඡායාරූප ඇතුළත් කිරීමට එතුමන්ලාගේ එකඟතාවය ලැබී තිබුණේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම ඡායාරූප ඇතුළත් කිරීම සඳහා වැය කර ඇති අමතර මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2018 හා 2019 යන වර්ෂවල රජයේ පාසල් පෙළ පොත්වලට එවකට අධ්‍යාපන අමාත්‍යවරයාගේ වර්ණ ඡායාරූපයක් ඇතුළත් කර තිබූ බව දන්නේද;

(ii) ඒ සඳහා රජයේ මුදල් භාවිතා කර තිබූ බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2007/2022

ගරු (ආචාර්ය) (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ග්‍රාම සංවර්ධන, පුහුණු හා පර්යේෂණ ආයතනයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2015/2022

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහජන බැංකුවේ, සහකාර කළමනාකරු තනතුරට උසස් කිරීම සඳහා අඛණ්ඩව වසර 02කට වරක් අයදුම්පත් කැඳවූ බවත්;

(ii) ඒ අනුව පවත්වන ලද තරඟ විභාගයෙන් ලකුණු 40ට වඩා ලබා ගන්නා ලද අයදුම්කරුවන්ට උසස්වීම් ලබා දුන් බවත්;

(iii) එහෙත්, 2015.12.31ට පසු මහජන බැංකුවේ, සහකාර කළමනාකරු තනතුරට උසස් කිරීමට අදාළ තරඟ විභාගය සඳහා අයදුම්පත කැඳවන ලද්දේ 2019.06.30 දින බවත්;

(iv) ඒ අනුව අදාළ විභාගය 2019.12.15 වන දින පවත්වන ලද බවත්;

(v) එම විභාගයේ කඩඉම් ලකුණ 50 දක්වා වැඩි කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත විභාගයේ කඩඉම් ලකුණ 50 දක්වා වැඩි කිරීමට හේතු කවරේද;

(ii) පෙර පැවති විභාගවලට ව්‍යුහාත්මකව හාත්පසින්ම වෙනස් ප්‍රශ්නපත්‍රයක් ලබා දීමට සහ එයට න්‍යායාත්මක ගැටලු සහිත ප්‍රශ්න ඇතුළත් කිරීමට හේතු කවරේද;

(iii) ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල නැවත පරීක්ෂා කර, අසාධාරණයට ලක් වූ 768 ක් පමණ වන මහජන බැංකුවේ සේවක/සේවිකාවන්ට සාධාරණය ඉටු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2022 ජූලි 22 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2026/2022

ගරු මධුර විතානගේ මහතා,— කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වකුගඩු අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදුවිය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2044/2022

ගරු කුමාරසිරි රත්නායක මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත කාලය තුළදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස ගම්මාන අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති නිවාස ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනතෙක් වැඩ අවසන් කර නොමැති නිවාස ගම්මාන තිබේ නම්, ඒවායේ නම් කවරේද;

(v) එම නිවාස ගම්මානවල වැඩ අවසන් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2019 සිට මේ වනතෙක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති හා මේ වනවිට ඉදිකරමින් පවතින නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2060/2022

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා මහාමාර්ග විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා හා ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2072/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඔවුන්ට එරෙහිව ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2096/2022

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සහ උප ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත එක් එක් ඩිපෝවේ සහ උප ඩිපෝවේ නම කවරේද;

(iii) එම එක් එක් ඩිපෝවේ සහ උප ඩිපෝවේ මේ වනවිට පවතින ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත එක් එක් ඩිපෝවේ සහ උප ඩිපෝවේ මේ වනවිට පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොතුවිල් හි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රාදේශීය උප ඩිපෝව, 2001 වර්ෂයේදී උප ඩිපෝවක් බවට පත් කරන ලද අතර එම ඩිපෝව මේ දක්වා උප ඩිපෝවක් ලෙසම පවතින බව එතුමා දන්නේද;

(ii) එම උප ඩිපෝව, ප්‍රධාන ඩිපෝවක් බවට උසස් කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2113/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ අලි-මිනිස් ගැටුම් හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ මරණයට පත්වන එක් පුද්ගලයෙකු වෙනුවෙන් ගෙවනු ලබන වන්දි මුදල කොපමණද;

(iii) අලි-මිනිස් ගැටුම් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2261/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවයට අලුතින් බඳවාගන්නා ලද අභ්‍යාසලාභී උපාධිධාරීන්ට ප්‍රසූත නිවාඩු ලබා නොදීමට තීරණයක් ගෙන තිබේද;

(ii) එම තීරණය හේතුවෙන් ඔවුන්ට බලවත් අසාධාරණයක් සිදු වී තිබෙන බව පිළිගන්නේද;

(iii) ඉහත තීරණය ඉවත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2457/2022

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂයේ මේ දක්වා ශ්‍රී ලංකාවට පැමිණ ඇති විදේශීය සංචාරකයන් සංඛ්‍යාව;

(ii) 2022 වර්ෂයේදී පැමිණෙතැයි අපේක්ෂා කරනු ලබන සංඛ්‍යාව;

(iii) විදේශීය සංචාරකයන් මඟින් 2022 වර්ෂයේදී උපයා ගැනීමට අපේක්ෂිත ආදායම;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2467/2022

ගරු රෝහණ දිසානායක මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම සතු මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ප්‍රමාණය එම සමාගම සතු එක් එක් වතුයාය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් සමාගම සතු ඉඩම් අතරින් වගා කරන ලද ඉඩම් ප්‍රමාණය සහ වගා නොකරන ලද ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වගා නොකරන ලද ඉඩම් වගා කිරීම සඳහා සැලැස්මක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2565/2022

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට වැවිලි සමාගම් විසින් කළමනාකරණය කරනු ලබන ශ්‍රී ලංකාවේ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වතුවල ඉඩම් අයිතිය රජය සතුව තිබේද;

(iii) නොඑසේ නම්, එම ඉඩම්වල අයිතිය රජයෙන් බැහැර කර සම්පූර්ණයෙන්ම වතු සමාගම් වෙත පවරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වතුවල ජීවත්වන ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමේදී අදාළ වතු සමාගම්වලින් අවසර ලබා ගත යුතු වන්නේද;

(ii) විශේෂයෙන්ම වතු නිවාස සඳහා පානීය ජල පහසුකම් හා විදුලිය ලබා ගැනීමේදී සහ නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් ලබා ගැනීමේදී අදාළ වතු සමාගම්වලින් අවසර ලබා ගත යුතු වන්නේද;

(iii) එම තත්ත්වය, රජයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බාධාවක් බව දන්නේද;

(iv) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා සුදුසු පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?